www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# දෙවන වාර පරීක්ෂණය 2019

**8 ශ්‍රේණිය** **තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය** **කාලය පැය 2 යි**

නම/ විභාග අංකයඃ

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

---

- පහත ප්‍රකාශනවල ඇති හිස්තැන් සඳහා සුදුසු පද, දී ඇති ලැයිස්තුවෙන් තෝරා ලියන්න.

01. පරිගණකය සමඟ කටයුතු කිරීමේ දී දෘඪාංග හා ......................... නිසි ලෙස ක්‍රියාත්මක නොවීමේ ගැටළු ඇති විය හැක.

02. යතුරු පුවරුව (Key Board) හා මූසිකය (Mouse) පරිගණකයට සම්බන්ධ කිරීම සඳහා ......................... කෙවෙනි හෝ USB කෙවෙනි භාවිත කළ හැකිය.

03. ෂඩ් දශමය (Hexa-Decimal) සංඛ්‍යා පද්ධතියේ සංකේතයන් ......................... ක් ඇත.

04. පරිගණකයේ දිනය හා වේලාව වැනි ප්‍රධාන සැකසුම් සිදුකිරීමට ......................... ගිණුමක් අවශ්‍ය විය හැක.

05. පරිගණකයක් භාවිතයෙන් නිර්මාණය කළ ගොනුවක් මත දකුණු බොත්තම ක්ලික් (Right click) කිරීමෙන් ලැබෙන මෙනුවේ ......................... මත ක්ලික් කිරීමෙන් එම ගොනුවේ විස්තර (ගුණාංග) දැක ගත හැකි ......................... වේ.

06. $100110_2$ යන සංඛ්‍යාවේ සංඛ්‍යා පාදය ......................... වේ.

ලැයිස්තුව :- [2 / Properties / මෘදුකාංග / පරිශීලක / 8 / 16 / පරිපාලක / PS2]

(ල. 3×6=18)

07. පරිගණකයේ දිනය, වේලා කලාපය (Time Zone), වේලාව පිහිටුවීමේ එක් වැදගත්කමක් සඳහන් කරන්න.

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

08. $12_{10}$ යන දශමය සංඛ්‍යාව ද්වීමය සංඛ්‍යාවක් බවට පරිවර්තනය කරන්න. (පියවර පෙන්වන්න.)



agaram.lk

09. යම් සිසුවෙකුගේ වයස ඇතුළත් කළ විට, වයස අවුරුදු 5 ට වැඩි නම් ''පාසලට ඇතුළත් කළ හැකියි'' යනුවෙන් ද වයස අවුරුදු 5 ට අඩුනම්'' පාසලට ඇතුළත් කළ නොහැක'' යනුවෙන් ද දර්ශනය වන පරිගණක වැඩසටහනක ආදාන (Input), ප්‍රතිදාන (Output) වෙන්කර දක්වන්න.


ආදාන :- ..............................................................................................................

..............................................................................................................


ප්‍රතිදාන :- ..............................................................................................................

..............................................................................................................

10. පහත 1 රූපයේ දක්වෙන වගුව නිර්මාණය කර ගැනීමට 2 රූපයේ දක්වෙන සංවාද කවුළුවේ A හා B සඳහා පිළිවෙලින් ඇතුළත් කළ යුතු අගයන් මොනවා ද?



1.රූපය




2.රූපය

A - .............................................  B - .............................................


11. පහත රූපයෙන් දක්වෙන්නේ ගොනුවක ගුණාංග (Properties) දක්වෙන සංවාද කවුළුවකි. ඒ ඇසුරෙන් එම ගොනුවේ විශාලත්වය (Size) හා ගොනුව නිර්මාණය කළ දිනය (Created Date) සඳහන් කරන්න.

විශාලත්වය : ..............................................................................

..............................................................................

නිර්මාණය කළ දිනය : ..............................................................................

..............................................................................




(ල. 4×5=20)



agaram.lk
Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

12. පරිගණකයකට සංදර්ශකය (Monitor) සම්බන්ධ කළ හැකි කෙවෙණි (Ports) පමණක් ඇතුළත් පිළිතුර වන්නේ කුමක් ද?

    (1) eSata සහ USB කෙවෙණිය (2) DVI සහ USB කෙවෙණිය

    (3) VGA සහ HDMI කෙවෙණිය (4) PS/2 සහ VGA කෙවෙණිය

13. හදිසි විදුලි බිඳ වැටීම් වලින් පරිගණකයට සිදුවන අනතුරු වළක්වා ගැනීමට භාවිත කළ හැකි උපකරණයක් වන්නේ කුමක් ද?

    (1) මූසිකය (Mouse) (2) යතුරු පුවරුව (Key Board)

    (3) සංදර්ශකය (Monitor) (4) අනවරත විදුලි සැපයුම් උපාංගය (UPS)

14. eSata කෙවෙණිය යොදාගනු ලබන්නේ කුමන උපාංගය සම්බන්ධ කිරීමට ද?

    (1) සංදර්ශකය (Monitor)

    (2) මූසිකය හෝ යතුරු පුවරුව (Mouse /Key Board )

    (3) ඉහළ තත්වයේ නාදක (HD Speaker)

    (4) බාහිර ආචයන උපාංග (External Storage Devices)

15. තාක්ෂණයේ දියුණුවත් සමග හඳුන්වා දුන්, උපාංග බොහොමයක් පරිගණකයට සම්බන්ධ කළ හැකි පොදු කෙවෙණියක් වන්නේ කුමක් ද?

    (1) HDMI කෙවෙණිය (2) eSata කෙවෙණිය

    (3) DVI කෙවෙණිය (4) USB කෙවෙණිය


16. වදන් සැකසුම් මෘදුකාංගයකින් (w) සිදු කල <u>නොහැකි</u> කාර්යය කුමක් ද?

    (1) ලේඛනයක් නිර්මාණය කිරීම (2) චිත්‍ර ඇඳීම

    (3) අක්ෂර නිවැරදිදැයි පරීක්ෂා කිරීම (4) අක්ෂර හැඩ ගැන්වීම



(ල. 3 x 5 = 15)

- **පහත වම්පස "කෙවෙනි රූප" තීරුවෙහි දැක්වෙන කෙවෙනි හඳුනාගෙන, ඒවායෙහි නම් දකුණු පස කෙවෙනි නාම තීරුවෙන් තෝරා අදාළ ඉංග්‍රීසි අකුර කෙවෙනිය ඉදිරියෙන් ලියන්න.**

| | කෙවෙනි රූප | | කෙවෙනි නාම | |
|---|---|---|---|---|
| 17. |  | .................... | A | HDMI කෙවෙනිය |
| 18. |  | .................... | B | RJ 45 ඊතර්නෙට් කෙවෙනිය |
| 19. |  | .................... | C | USB කෙවෙනිය |



agaram.lk
Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

| | | | | |
|---|---|---|---|---|
| 20. |  | ................... | D | PS2 කෙවෙනිය |
| 21. |  | ................... | E | DVI කෙවෙනිය |

(4 x 5 = 20)

- **22 සිට 26 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා වදන් සැකසුම් මෘදුකාංග භාවිතයෙන් සකසා ඇති පහත දැක්වෙන ලේඛනය යොදා ගන්න.**

මෙම ලේඛනය පිළියෙල කිරීමේදී සිදු කර ඇති හැඩසවීම් සඳහා භාවිත කර ඇති මෙවලම්, පහත මෙවලම් තීරුවෙන් තෝරා එහි අකුරු (ලේබලය) කොටුව තුළ ලියන්න.

The Great Wall of China ← 22 - .......

A world heritage site ← 23 -........



← 24-........


25 -.........

It is the largest **man-made structure** in the world. It was built over a long period of time since 700 B.C. The wall is 21196 kilometers long and is made of more material include list, bellow.

- Stone
- Brick
- Wood
- Tempered earth etc.

← 26 -........

It is said that, this is the only structure on the earth that can be seen from space. It is considered as a world heritage site by **UNESCO**.





(ල. 3 x 5= 15)



agaram.lk
Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

**8 ශ්‍රේණිය** **තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය**

- ගැලීම් සටහන් ඇඳීමේ දී භාවිත කරන සම්මත හැඩතල කිහිපයක් පහත වම් පස තීරුවේ දක්වේ. ඒවායෙහි භාවිතය සම්බන්ධ ප්‍රකාශන දකුණු පස තීරුවෙහි ඇත. නිවැරදි හැඩතලය හා ඊට අදාළ ප්‍රකාශනය ඊතල මගින් සම්බන්ධ කරන්න.

| | සම්මත හැඩතලය | භාවිතය |
|---|---|---|
| 27. |  | ආරම්භය / අවසානය |
| 28. |  | ආදාන / ප්‍රතිදාන |
| 29. |  | තේරීම |
| 30. |  | සැකසීම |

(ල. 3 x 4 = 12)

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!



agaram.lk